# ප්‍රවෘත්ති නිවේදනය

## ජාතික පාරිභෝගික මිල දර්ශකය (පදනම 2013 = 100) : 2016 සැප්තැම්බර්

## ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

## ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය

ජාතික පාරිභෝගික මිල දර්ශකය නිවේදනය කරමින් ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් ආචාර්ය අමර සතරසිංහ මහතා වාර්ෂික උද්ධමනය 2016 සැප්තැම්බර් මාසයේ 4.7% ක් ලෙස ගණනය කර ඇති බව ප්‍රකාශ කලේය. උද්ධමනය 2016 අගෝස්තු මාසයේදී 4.5% ක් විය. 2016 සැප්තැම්බර් මාසයේ උද්ධමනය සඳහා ආහාර කාණ්ඩයේ 2.1% ක හා ආහාර නොවන කාණ්ඩයේ 2.7% ක දායකත්වයක් පිළිවෙලින් ලබා දී ඇත.

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව 2016 සැප්තැම්බර් මස ජාතික පාරිභෝගික මිල දර්ශකය 113.5 ලෙස ප්‍රකාශයට පත් කර ඇත. සැප්තැම්බර් මාසයේ දර්ශකය අගෝස්තු මාසයේ දර්ශකය (113.3) හා සංසන්දනය කල විට 0.2ක දර්ශකාංක වැඩිවීමක් හා ප්‍රතිශතයක් ලෙස 0.2ක වැඩිවීමක් වාර්තා වේ. මෙම මාසික වෙනස්වීමට ආහාර කාණ්ඩයේ වියදම්වල වටිනාකම 0.07% කින් වැඩිවීම හා ආහාර නොවන කාණ්ඩයේ වියදම්වල වටිනාකම 0.18% කින් වැඩිවීම බලපා ඇත.

2016 අගෝස්තු මාසය හා සසඳන කල 2016 සැප්තැම්බර් මාසය සඳහා ආහාර කාණ්ඩයේ වියදම්වල වටිනාකම 0.07%ක වැඩිවීමක් දක්නට ඇත. මෙම වැඩිවීම සඳහා කෙසෙල්, පැපොල්, දෙහි, ලොකුළූණු, සහල්, පොල්, අඹ, කුකුල් මස්, මයිසූර් පරිප්පු, අන්නාසි, කඩල සහ වියළි හාල්මැස්සන් යන ආහාර ද්‍රව්‍යවල මිල වැඩිවීම ප්‍රධාන වශයෙන් බලපා ඇත. එසේ වුවත් එළවළු, අමු මිරිස්, බිත්තර, අර්තාපල්, අළුත් මාළු සහ තිරිඟු පිටි යන ආහාර ද්‍රව්‍යවල මිල අඩුවීමක් වාර්තා වී ඇත.

2016 අගෝස්තු මාසය හා සසඳන කල 2016 සැප්තැම්බර් මාසය සඳහා ආහාර නොවන කාණ්ඩයේ වියදම්වල වටිනාකම 0.18%ක වැඩිවීමක් දක්නට ඇත. මෙම ආහාර නොවන කාණ්ඩයේ වියදම්වල වටිනාකම වැඩිවීම සඳහා 'මධ්‍යසාර පාන වර්ග, දුම්කොළ හා මත්ද්‍රව්‍ය', 'අධ්‍යාපන', 'රෙදිපිළි හා පාවහන්', 'විවිධ භාණ්ඩ හා සේවා' සහ 'ආපනශාලා හා හෝටල්' යන කාණ්ඩවල වැඩිවීම ප්‍රධාන වශයෙන් බලපා ඇත. පසුගිය අගෝස්තු මාසය හා සසඳන කල 'ගෘහ උපකරණ හා ගෘහ ඒකක නඩත්තු කටයුතු' කාණ්ඩයේ සුළු වැඩිවීමක් වාර්තා වී ඇත. මෙම මාසයේ 'නිවාස, ජලය, විදුලිය, ගෑස් හා වෙනත් ඉන්ධන', 'සෞඛ්‍ය', 'ප්‍රවාහන', 'සන්නිවේදන', සහ 'විනෝදාත්මක හා සංස්කෘතික' යන කාණ්ඩවල වියදම්වල වටිනාකම නොවෙනස්ව පැවතුණි. 'මධ්‍යසාර පාන වර්ග, දුම්කොළ හා මත්ද්‍රව්‍ය' කාණ්ඩයේ වියදම්වල වටිනාකම වැඩිවීම සඳහා පුවක් සහ බුලත්වල මිල වැඩිවීම ප්‍රධාන වශයෙන් බලපා ඇති අතර, 'අධ්‍යාපන' කාණ්ඩයේ වියදම්වල වටිනාකම වැඩිවීම සඳහා සැප්තැම්බර් මාසයේ ජාත්‍යන්තර පාසල් ගාස්තු වැඩිවීම ප්‍රධාන වශයෙන් බලපා ඇත.




**ජාතික පාරිභෝගික මිල දර්ශකයේ විචලනය (පදනම : 2013 = 100)**

| වර්ෂය | මාසය | මිල දර්ශකය | මාසික වෙනස්වීම (%) | වාර්ෂික උද්ධමනය (%) |
|---|---|---|---|---|
| **2015** | සැප්තැම්බර් | 108.4 | 0.0 | 1.9 |
| | ඔක්තෝම්බර් | 109.2 | 0.7 | 3.0 |
| | නොවැම්බර් | 112.0 | 2.6 | 4.8 |
| | දෙසැම්බර් | 113.2 | 1.1 | 4.2 |
| **2016** | ජනවාරි | 112.0 | -1.1 | -0.7 |
| | පෙබරවාරි | 110.8 | -1.1 | 1.7 |
| | මාර්තු | 110.0 | -0.7 | 2.2 |
| | අප්‍රේල් | 111.6 | 1.5 | 4.3 |
| | මැයි | 113.7 | 1.9 | 5.3 |
| | ජූනි | 116.1 | 2.1 | 6.4 |
| | ජූලි | 115.2 | -0.8 | 5.8 |
| | අගෝස්තු | 113.3 | -1.6 | 4.5 |
| | සැප්තැම්බර් | 113.5 | 0.2 | 4.7 |

ආචාර්ය ඒ. ජේ. සතරසිංහ

අධ්‍යක්ෂ ජනරාල්

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

දුරකථන අංක: 011-2147001 / 011-2147020